**දශක තුනක් තිස්සේ උතුරේ පැවැති යුද්ධයේ අවසාන දින කිහිපය තුළදී රජයේ හමුදාවන්ට බාරවූ එල්.ටී.ටී.ඊ. ඉදිරි පෙළ සාමාජිකයන් අතර එම සංවිධානයේ දේශපාලන අංශයේ කාන්තා නායිකාව තමිළිනී ජෙයක්කුමාරන් ද විය. යුද ජයග්‍රහණයෙන් පසුව රජය ක්‍රියාත්මක කළ පුනරුත්ථාපන වැඩ පිළිවෙළ යටතේ නැවත සමාජ ගත කෙරුණු ඇය ඉන් වසර කිහිපයකට පසුව මහරගම පිළිකා රෝහලේදී ජීවිතක්ෂයට පත්වූයේ පිළිකා රෝගියෙකුවය. පිළිකා රෝගයට ගොදුරුව මරණය අභිමුව සිටියදී ඇය එල්.ටී.ටී.ඊ. සංවිධානය හා සම්බන්ධ සිය ක්‍රියාකාරකම් සහ බිහිසුණු අත්දැකීම් පිළිබඳ තබන ලද ලිඛිත සටහන් පසුව දෙමළ භාෂාවෙන් පොතක් ලෙස ප්‍රකාශයට පත් කෙරිණි. එහි ඇතුළත් කරුණු දෙමළ සමාජය තුළ මහත් විවාදයටද, බාහිර සමාජයේ මහත් අවධානයටද ලක්වීය.**

**අතිමහත් සමාජ පිරිවැයක් දරමින් එල්.ටී.ටී.ඊ. යුද සංවිධානය වැනසීමට රජයේ හමුදා සමත් වුවද, එම සංවිධානයේ නැඟීමට සහ පැවැත්මට බලපෑ හේතු නැසීමට රජය මෙතෙක් සමත්වී නැත. උතුරේ දෙමළ ජාතිවාදයද, නැඟෙනහිර මුස්ලිම් ජාතිවාදයද, දකුණේ සිංහල ජාතිවාදයද මේ මොහොතේ නව වටයකින් හිස ඔසවමින් සාමකාමී පුරවැසි සමාජයට සන්නිවේදනය කරන පනිවිඩයද බෙහෙවින් භයානකය. එවැනි පසුබිමක මද අස්වැසිල්ලක් භුක්තිවිඳිමින් සිටින දැනුම්වත් සිංහල පුරවැසි සමාජයට තමිළිනීගේ මරණාසන්න ස්මරණය මගින් ලබාදෙන පනිවිඩයේ ඇති සුවිශේෂීත්වය සළකා එහි සිංහල පරිවර්තනය කොටස් වශයෙන් ඔබ වෙත ගෙනඑන්නෙමු.**

**තමිළිනී දෙමළ බසින් තැබූ සටහන් සිංහලයට නැඟූ ආචාර්ය ස්වාමිනාදන් විමල් සහ ඒ සඳහා අවශ්‍ය සෙසු සම්පත්දායකත්වය සැපයූ සිනමාවේදී ධර්මසිරි බණ්ඩාරනායක දෙපළට මෙහිදී අපගේ විශේෂ ස්තුතිය පිරිනමමු.**

සන්නසට සකස් කරන්නේ - ශ්‍රීලාල් සෙනෙවිරත්න



# තමිළිනීගේ කතාව

## 8

පරන්තන් සහ කරඩිපෝක්කු යන ගම් දෙකට මැදින් පිහිටි උතුරු පළාත් වී පර්යේෂණ ආයතනයට අයත් විශාල ගබඩා සහ සේවක නිවාස ඉන්දීය හමුදාවේ කඳවුරක් බවට පත්වීය. අප අසා නොසිටි බොහෝ භාෂාවලින් ඔවුහු කතා බහේ යෙදුණාහ. දිගු හිස කෙස් සහ රැවුල සහිත පංජාබි හටයෝද, කහ පැහැ මිටි ශරීරවලින් යුතු ගුර්කා හටයෝද, පාසල් පෙළ පොත්වල අපි ඉගෙනගත් ඉන්දියාව අපේ දෑස් ඉදිරිපිටට ගෙන ආහ. ''සයන්ස් සෙන්ටර්'' නමින් හැඳින්වුණු අපේ පෞද්ගලික පන්ති ආයතනය පිහිටා තිබුණේ කරඩිපෝක්කු නම් ස්ථානයෙහිය. එයට කුමරපුරම් සහ පරන්තන්වල සිට ශිෂ්‍යයෝ රංචු ගැසී ගමන් කිරීම සාමාන්‍යයෙන් සිදුවන්නකි. එහි දී ගැහැණු ළමුන් දුටු විට ''ඒයි කෙල්ලේ කසාද බඳිමුද?'' යැයි කියා තවත් මොනවදෝ වෙනත් භාෂාවන්ගෙන් පවසා ඉන්දීය හමුදාවේ හටයෝ කෑ ගසති. එවන් අවස්ථාවල හිස හරවා බැලීමට නොහැකි තරමේ බියක් ඇතිවෙයි.

කෙටි කලක් පැවැති සාමකාමී තත්ත්වය නැවත කැලඹීමට පත්විය. විමුක්ති කොටි සංවිධානය ඉන්දීය හමුදාව සමඟ යුද්ධය ආරම්භ කර ඇති බව බොහෝ දෙනා අතර කතාබහ ඇතිවූහ. තරුණ ගැහැණු ළමයින්ට එය මහත් සේ බියකරු කාලයක් බවට පත්විය. යාපනයේ සමහර තැන්වල තරුණියන්ට ඉන්දීය හමුදාව ලිංගික අතවර කරන බව ජනතාව අතර ප්‍රචලිත විය. කිලිනොච්චියේ ද එවැනි සිදුවීම් සිදුවූවාදැයි මම නොදනිමි. එහෙත් මගේ ලොකු අම්මාගේ දුව තම නිවසෙහි තබාගෙන සිටීම අනාරක්ෂිත යැයි කියා ලොකු තාත්තා රෑ කල ඇයව කඳවාගෙන ඇවිත් අප නිවසෙහි නතර කළේය. ගැහැණු දරුවන් වූ අප ආරක්ෂා කිරීමත්, පාසලට සහ පෞද්ගලික පන්තිවලට යැවීමත් වැඩිහිටියන්ට මහත් අරගලයක් විය. එවක මම අධ්‍යාපන පොදු සහතික පත්‍ර

## කොටි සංවිධානයට එක්වුණෙමි

සාමාන්‍ය පෙළ විභාගයට සූදානම් වෙමින් සිටියෙමි.

දිනක් පාසල් වේලාවේදී බිහිසුණු අයුරින් වෙඩි ශබ්ද ඇසෙන්නට විය. පරන්තන් ප්‍රදේශය වටකර සෝදිසි මෙහෙයුමක් දියත් විය. සිසුන් වන අපි බියෙන් මේස යටට රිංගා ගත්තෙමු. ටික වේලාවකින් අපේ පාසල් භූමියට පැමිණි ඉන්දීය හමුදාව පන්ති කාමරවල පිරෙන්නට වූහ. ඔවුහු අපේ පාසලේ විදුහල්පතිගෙන් කුමක්දෝ විමසා සිට පහර දෙන්නට පටන් ගත්හ. අප මහත් ගෞරවයක් දක්වන අපේ විදුහල්පතිතුමා අපේ ඉදිරිපිටම ප්‍රහාරයට ලක්ව තොල් ඉදිමී ලේ ගලන තුවාල සහිතව සිටින දර්ශනය දුටු සිසුහු ශබ්ද නගා හඬන්නට වූහ.

ගමේ ජනතාව ගැහැණු සහ පිරිමි වශයෙන් වෙන්ව ටික වේලාවක් අත් ඔසවාගෙන සිටින ලෙස අණකර පාසලේ ක්‍රීඩා පිටියට කැඳවාගෙන ආහ. ඔවුනට දණ ගසා සිටින ලෙසට අණ කෙරුණි. ඉන්දීය හමුදාවට ප්‍රහාර එල්ල කර පලාගිය විමුක්ති කොටින්ව සොයා දියත් කළ එම හමුදා මෙහෙයුම එදින සවස වනතෙක්ම පැවැත්විණි.

දිනපතා පාසලටත් සවස් කාලයෙහි අමතර පන්තිවලටත් ගොස් පැමිණීම යනු ගිනි ගොඩක් මැදින් ගමන් කිරීමක් වැනි වීය.

ඉන්දීය හමුදාවේ සහායට උන් සමහර දෙමළ තරුණයෝ ගමේ සමහර තරුණයන්ව බලහත්කාරයෙන් අල්ලාගෙන ගොස් පුහුණුව ලබාදෙන බවටත් ආරංචි විය. එහෙයින් අපේ පන්තිවල ඉගෙන ගනිමින් සිටි ශිෂ්‍යයෝ අධ්‍යාපනය අතරමග නතර කර අතුරුදන්වීමට පටන් ගත්හ. නළල වටා රතු රෙදි කඩක් බැඳගෙන සිටි දෙමළ තරුණයෝද ඉන්දීය හමුදාව සමඟ එක්ව මඟ දිගට උන්හ. ඔවුන්ගේ බැල්ම සහ කියන දේවල් අසන දකින විට සිත තුළ කෝපය ගොප් දමයි. එහෙත් ඒවා ඉවසා ඉන්නවා හැර සිසුන් වූ අපට වෙනත් කළ හැකි දෙයක් තිබුණේ නැත. කැළෑවක් තුළ සැඟවී සිට ප්‍රහාරයන් එල්ල කරන කොටි සංවිධානය කෙරෙහි අසීමිත ගෞරවයක් සහ විශ්වාසයක් ඇතිවිය. මෙම දුක් ගැහැටවලට විසඳුමක් ලබාදිය හැක්කේ ඔවුන්ට පමණි යන සිහිනය මනසේ ඇති විය. නව යොවුන් වියෙහි මිහිරි අත්දැකීම් ආශ්‍රිත මතකයන් මා තුළ එතරම් නොමැත. කුමරපුරම් මුරුගන් කෝවිලේ පැවැත්වෙන 'ආනි උත්තර' උත්සවයට පාවාඩෙ සහ තාවණී ඇඳුම් ඇඳගෙන පාසල් මිතුරියන් සමඟින් ගිය අත්දැකීම් ද, එම කාලයෙහි අතිශය ජනප්‍රිය ගීතයක් වූ 'රසාත්ති මනසිල' නම් ගීතයෙහි තනුව නාදස්වරම් වාදකයා වාදනය කරන විට එය කරන්නේ අප ගැන සිතා ගෙන යැයි සිතමින් හිත ඇතුළෙන් සිනාසුණු අත්දැකීම් ද, පොරික්කඩවෙ අම්මාන් කෝවිලහි පැවැත්වුණු ශාන්තන්ගේ සංගීත කණ්ඩායමෙහි සංගීතය ඇසීමට රාත්‍රියෙහි ගොස් පසුදින පෞද්ගලික පන්තියේ ගණිත පාඩම වේලාවේදී නිදි කිරා වැටීම නිසා කෝපයට පත්වූ මරියදාස් මාස්ටර් ''රෑ තිස්සේ සිංදු අහලා නිදාගන්ඩද උඹලා මෙහෙ ආවේ?'' යැයි බැණවැදී නිදා වැටුණු සියලුම දෙනා පන්තියෙන් එළියට එළවීමත්, මිතුරියන් සමඟ හුවමාරු කරගත් කමල්හසන්, රජිනිකාන්ත් රඟපෑ චිත්‍රපට විචාරත් පමණි, මේ වන විට මතකයෙහි ඇත්තේ.

1990 වසරේදී ප්‍රේමදාස-කොටි සාම කාලය ඇතිවීමත් සමඟ මින් මතු සියලු ප්‍රශ්න විසඳනු ඇතැයි නැවතත් වැඩිහිටියෝ කතා බහ කරන්නට වූහ. එහෙත් නැවතත් ප්‍රශ්න දිග්ගැස්සුණොත් කොටි සංවිධානයට යන එක තමයි නිවැරදි තීරණයැයි පන්ති කාමරයෙහි දී තරුණ තරුණියෝ රහසිගතව කතා වූහ. දුක් වේදනා විඳින අපේ ජනතාව වෙනුවෙන් කුමක් හෝ කළ යුතුය යන්න මගේ හිතෙහි දැඩි ලෙසින් තැන්පත්ව තිබූ නමුත් සංවිධානයට බැඳී අරගලය කළ යුතුය යනුවෙන් මා සිතා සිටියේ නැත. මගේ අරමුණ වූයේ විශ්වවිද්‍යාලයට ගොස් උසස් අධ්‍යාපනය ලැබීමයි. මම මගේ පාසලෙහි ජ්‍යෙෂ්ඨ ශිෂ්‍ය සංගමයෙහි ලේකම් තනතුර ද, ශිෂ්‍ය නායිකා තනතුර ද දැරුවෙමි. කුඩා වියෙහි සිට පාසල් වේදිකාවේ කතා පැවැත්වීම, කවි ගායනය, විවාද මණ්ඩප, නාට්‍ය ආදියට සහභාගි වී විදුහල්පති සහ ගුරු භවතුන්ගේ ප්‍රසංසාවට ලක්ව උන්නෙමි. එහෙයින් මම අපේ පාසලේත් අනෙක් පාසල්වලත්, ප්‍රකට අයෙකු බවට පත්ව සිටියෙමි. උසස් අධ්‍යාපනයක් ලබා හොඳ රැකියාවක් කරමින් පියා නොමැති මගේ පවුල ආරක්ෂා කරගෙන ඉහළ තත්ත්වයට පත්විය යුතුය යන්න හැර වෙනත් සිතිවිලිවලට එවක මගේ හිතේ ඉඩක් තිබුණේ නැත.



36 වන පිටට

සුභාවිත ගීතයේ අන්තර්ජාල නවාතැන - තිසර ගුවන්විදුලිය www.thisara.com